# මව්බිම එක්සේසත් කළ රාජ්‍ය නායකයා

පොදුජන යුගයක දෙවන දිගහැරුමක සිට අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිඳුන් ජනපති දෙවන පදවි ප්‍රාප්තිය අරඹයි. සංස්කෘතික, ආගමික, ආර්ථික, දේශපාලනික හා සමාජයීය සංවර්ධනයක සුබ පෙර නිමිති අත්විඳිමින් සිටිමු. එකී සංවර්ධන සංග්‍රාමයක් තුළ සක්‍රීයව සිටිද්දී දෙස් විදෙස් ප්‍රතිගාමීන්ගේ අවලාද හා කුමන්ත්‍රණ මැද, දේශප්‍රේමී ප්‍රගතිශීලීන්ගේ දහදිය මතින් ආ මේ ගමනේ අභිමානය අප ගෞරවයෙන් සිහිපත් කරමු.

2005 දී අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනපති කළ, කෘතවේදී ලාංකික පොදු ජනතාව 2010 දී විජයග්‍රාහී ජනවරමක් ලබාදුන්නේය.

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා රාජ්‍ය නායකත්වය භාරගනිද්දී අභියෝග රැසකට මුහුණදෙන්නට සිදුවිය. රටේ ජනතාව ත්‍රස්තවාදයෙන් ආරක්ෂා කිරීම, ජනතාවගේ එදිනෙදා ප්‍රශ්ණ විසඳීම, රට බෙදීමට එරෙහි සටන ඉදිරියට ගෙනයාම, එහිදී වන දෙස් විදෙස් කුමන්ත්‍රණ පරාජය කිරීම ඒ කාර්යයන් අතර විය. සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු, තරුණ, ශිෂ්‍ය, කාන්තා, රණවිරු බලවේග ඒ සඳහා සහාය ලබාදුන්නේ වසර 40 කට වැඩි දේශපාලන නායකත්වයකටය. එවැනි පළපුරුදු කෘතහස්ත අත්දැකීම්වලින් පෝෂණය ලැබූවකුට මිස ඉහත අභියෝගයන්ට මුහුණදෙමින් රට දිනවිය නොහැක. වෘත්තීය සමිති ව්‍යාපාර, මහජන ව්‍යාපාර සමග කටයුතු කළ කෙනෙකුට මිස රටක් සමබරව, රටේ අවශ්‍යතාවය තේරුම්ගෙන රටක් මෙහෙයවිය නොහැක. අභියෝගයන්ට අභියෝගයක් වෙමින් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා වසර 500 කට පසු ලක්දිව එක්සේසත් කෙළේය.

පුරා වසර තිහක් ලාංකික ජන ජීවිතය උඩු යටිකුරු කරමින් ක්‍රියාත්මක වූ බෙදුම්වාදී ත්‍රස්තවාදය නිසා රට සංවර්ධනය කිරීමට තිබූ කාලයෙන් වසර තිහක් අපෙන් උදුරාගෙන තිබුණි. එම කාලය අප නැවත ලබා ගත යුතුව ඇත. කඩිනම් සංවර්ධන කාලරාමුවක් ක්‍රියාත්මක වී ඇත්තේ ද දිනාගත් යුද්ධය මෙන් අහිමි වූ කාලය දිනාගැනීමටයි.

පෙර මුතුන් මිත්තෝ ඉතිහාසයේ පියගැටපෙළ නිර්මාණය කළෝය. එවුන්නන්ගේ දරු මුණුපුරන් වූ අප ඔවුන් උරුම කළ අපේම උරුමය රකිමින් එය මතු පරපුරට තිළිණ කළ යුත්තේය. එය ඉතිහාසය අපට පවරා ඇති වගකීමයි. එකී වගකීම පෙරදැරිව නිර්මාණය වූ 'මහින්ද චින්තන' ප්‍රතිපත්තිය අද ජනපති දෙවන පදවි ප්‍රාප්තිය සිදුවන මේ මොහොතේ යථාර්තයක් බවට පත්ව නවමු සංවර්ධන පරිච්ඡේදයකට ලංකාව යොමුකරයි.

ඈත අතීතයේ පැවති නැව්තොටවල් හැරුණු විට ලංකා ඉතිහාසයේ වරායක් ඉදිවන්නේ වසර 500 කට පමණ පෙර වූ පෘතුගීසීන්ගේ ලංකා ගමනයට සමගාමීවය. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිඳුන්ගේ අදහස මත ඉදිවූ හම්බන්තොට වරාය වසර 500 කට පසු සිදුවන ඉතිහාසයේ නවමු පෙරළියයි. මෙහි සංවර්ධනය රට පුරා විහිදුවනු ඇත.

කෘෂි, වාරි, ජල, විදුලි, අධ්‍යාපන, සෞඛ්‍ය, කාර්මික, නව තාක්ෂණික, සංස්කෘතික වැඩපිළිවෙලයන් හා ව්‍යාපෘති සක්‍රීය ලෙස රට පුරා ක්‍රියාත්මකය. අහරින් රට ස්වයංපෝෂිත කිරීමට ගොවි ජනතාව සමග ඇතිකළ මහා පරිවර්ථනය බිහිකළ දේශය බවට පත් කෙළේය. ඈත පිටිසර දුෂ්කර ගම්මාන දක්වා සංවර්ධනයේ ප්‍රතිලාභ ගලායන්නේ නගරයේ ජනතාව භුක්ති විඳින සියළු වරප්‍රසාද ග්‍රාමීයත්ව ආරක්ෂා කරමින් ගැමියනට ලබාදීමටය. ග්‍රාමීය සංවර්ධනය උදෙසා මේ සා විශාල මුදලක් ගමට ගලාගිය පළමු අවස්ථාව මෙය විය. ගමට අළුත් ප්‍රවේශයක් ලබාදෙමින් ගමේ තරුණ තරුණියන් සංවර්ධනයේ කොටස් කරුවන් කොට ඇත. කළාලයන් වන් මාර්ග රටපුරා දිවයන්නේ එවන් වූ සංවර්ධනයේ පල නෙලාගනු පිණිසයි. එකී එල තුළින් රජයේ අපේක්ෂාව අළුත් ආර්ථික බලවේගයන් නිර්මාණය කොට ඉදිරියට යාමය. ඒ නිසාම ලෝකයේ බලවත් රටවල්වල ආර්ථිකය කඩා වැටී සේවකයින් ලක්ෂ ගණනින් ඉවත්කරන විට මහින්ද චින්තනය ආයතන හා සේවකයා සුරක්ෂිත කරන්නට සමත්විය.

අප අමාත්‍යාංශය යටතේ, මහින්ද චින්තන ප්‍රතිපත්තිය තුළ වන 'හිඟයකින් තොරව පානීය ජලය' තේමාව යථාර්තයක් බවට පත්කරමින් නගරයේ පමණක් නොව ඈත දුෂ්කර ප්‍රදේශ දක්වා පානීය ජල හා සනීපාරක්ෂක පහසුකම් සඳහා වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කොට ඇත. ලාංකික

ජනගහනයෙන් පිරිසිදු පානීය ජලය ලැබෙනුයේ 80% කට පමණි. මහින්ද චින්තන ප්‍රතිපත්තිය තුළ පානීය ජල සම්පාදනයේ ඉතිරි අභියෝගයන් ද අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිඳුන්ගේ කාල පරාසය තුළම අපට ජයගත හැකිවනු ඇත. වසරකට නව ජල සම්බන්දතා 100,000 ක් හා වසරින් වසර 150,000 බැගින් වැඩිවන සේ ලබාදීමට කටයුතු කෙරෙනු ඇත. විසල් ජල සම්පාදන ව්‍යාපෘති, ජල සම්පාදන ක්‍රම, අපජලපවහන ව්‍යාපෘති, ප්‍රජා ජලසම්පාදන ව්‍යාපෘති, ග්‍රාමීය ජල සම්පාදන ක්‍රම, වැසි ජලය සුරැකුම, නව තාක්ෂණ ක්‍රමවේදයන් හඳුන්වා දීම, ජල සැපයුම් හා සම්බන්ද නව සේවාවන් හඳුන්වා දීම සහ මූල්‍යාධාර ක්‍රම ක්‍රියාත්මක කෙරේ.

දිනූ මව්බිම රකිමින් සංවර්ධන සංග්‍රාමයහි සක්‍රීයව සිට අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිඳුන්ගේ අභිමානවත් ජනපති පදවි ප්‍රාප්තියේ දෙවන දිග හැරුමට මව්බිමේ ජනතාව සමග සුබ පතමු.

**දිනේෂ් ගුණවර්ධන**
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය
මහජන එක්සත් පෙරමුණේ නායක